*සැ. යු.* - 2015.01.23 දින පළ වූ අංක 1,899 *දරන ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,900 - 2015 ජනවාරි මස 30 වැනි සිකුරාදා - 2015.01.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 104 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 106 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 110 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 පෙබරවාරි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 පෙබරවාරි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - තඹුත්තේගම

තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද සහ හිමිකම් නොකියන ලද පහත උපලේඛනයේ විස්තර කර ඇති භාණ්ඩ 2015.02.28 වැනි දින පෙ. ව. 9.30 ට තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙම වෙන්දේසිය සඳහා ඉදිරිපත් කර ඇති කිසියම් භාණ්ඩයක් පිළිබඳ අයිතිවාසිකම් කියන තැනැත්තෙකු සිටී නම් එම අයිතිවාසිකම් වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 9.30 ට පෙර ලිඛිතව මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණයෙ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන එදින පෙ. ව. 8.30 සිට පෙ. ව. 9.30 දක්වා වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

04. වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා එම භාණ්ඩ එදින ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලු ගෙවීම් මුදලින් පමණක් කළ යුතු ය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා මුදල් ගෙවීමේ දී සහ එම භාණ්ඩ භාර ගැනීමේ දී භාණ්ඩ මිලදී ගත් පුද්ගලයා විසින් තම ජාතික හැඳුනුම්පත අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතු ය.

06. අධිකරණය විසින් තීරණය කරන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

07. මෙම වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු අතර, පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාර ගනු නොලැබේ.

08. මෙම වෙන්දේසිය පිළිබඳ සියලු කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව ද දන්වා සිටිනු ලැබේ.

සනත් ජේ. මොරවක,
මහෙස්ත්‍රාත්,
තඹුත්තේගම.

2014 දෙසැම්බර් මස 19 වැනි දින,
තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 17382 | ලි. ප. අංක SG 5970 සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 02. | 16509 | ලි. ප. අංක 75 - 3718 එම් වර්ගයේ අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 03. | 4069 | ලි. ප. අංක SG 1388 යුනිමෝ වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 04. | 10282 | ලි. ප. අංක SD 4255 ඇග්‍රොටෙක් වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 05. | 18563 | ලි. ප. අංක SI 2019 සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 06. | 16835 | ලි. ප. අංක රහිත ඇග්‍රොටෙක් වර්ගයේ අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 07. | 10759 | ලි. ප. අංක රහිත සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 08. | 13881 | ලි. ප. අංක රහිත සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 09. | 15706 | ලි. ප. අංක රහිත කුබෝටා වර්ගයේ අත්ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 10. | 18710 | ලි. ප. අංක රහිත එඩ්ග්‍රෝ වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 11. | 11173 | ලි. ප. අංක රහිත ඇග්‍රිමෙක් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය (අමතර කොටස් සඳහා) |
| 12. | 13944 | ලි. ප. අංක රහිත සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය (අමතර කොටස් සඳහා) |
| 13. | 18152 | ලි. ප. අංක රහිත සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය (අමතර කොටස් සඳහා) |
| 14. | 17190 | ලි. ප. අංක රහිත සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය (අමතර කොටස් සඳහා) |
| 15. | 5993 | ලි. ප. අංක රහිත සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය (අමතර කොටස් සඳහා) |
| 16. | 18385 | ලි. ප. අංක රහිත සෙන්ෆින් වර්ගයේ අත්ට්‍රැක්ටරය (අමතර කොටස් සඳහා) |
| 17. | 0577 | ලි. ප. අංක NCJG - 2028 දරන කින්ග්ටන් වර්ගයේ යතුරුපැදිය |
| 18. | 91246 | ලි. ප. අංක NCMN - 2395 දරන ලොන්ගියා වර්ගයේ යතුරුපැදිය |
| 19. | A 1035/12 | ලි. ප. අංක 144 - 7572 දරන හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය |
| 20. | A 189/13 | ලි. ප. අංක 93 - 8961 දරන හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය |
| 21. | 39750 | ලි. ප. අංක 116 - 7973 දරන සුසුකි වර්ගයේ යතුරුපැදිය |
| 22. | A 1048/10 | ලි. ප. අංක 113 - 3059 දරන හොණ්ඩා චැලි වර්ගයේ යතුරුපැදිය |
| 23. | 44475 | ලි. ප. අංක 134- 1329 දරන යමහා වර්ගයේ යතුරුපැදිය |
| 24. | 12931 | ලි. ප. අංක NCVQ-7086 දරන බජාජ් ඩිස්කවරි වර්ගයේ යතුරුපැදිය |
| 25. | 15004 | ලි. ප. අංක රහිත ප්ලැටිනා වර්ගයේ යතුරුපැදිය |
| 26. | 90662 | ලි. ප. අංක රහිත බජාජ් බොක්සර් වර්ගයේ යතුරුපැදිය |
| 27. | A 186/13 | ලි. ප. අංක රහිත ටීවීඑස් වර්ගයේ යතුරුපැදිය |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 28. | A 723/13 | ලි. ප. අංක රහිත යමහා වර්ගයේ යතුරුපැදිය (අමතර කොටස් සඳහා) |
| 29. | A 191/13 | ලි. ප. අංක රහිත යමහා වර්ගයේ යතුරුපැදිය (අමතර කොටස් සඳහා) |
| 30. | A 1430/13 | නොකියා වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 31. | A 1046/10 | නොකියා වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 32. | A 1046/10 | සෝනි එරික්සන් ජංගම දුරකථන 01යි |
| 33. | A 430/13 | අයිබීඑම් පරිගණක මොනිටර් 01යි |
| 34. | 2932 | පරිගණක මුද්‍රණ යන්ත්‍ර 01යි |
| 35. | 13496 | ෂෙල් වර්ගයේ ගෑස් සිලින්ඩරය |
| 36. | 13496 | යකඩ ගෑස් ලිප |
| 37. | 19591 | ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩරය |
| 38. | 19591 | යකඩ ගෑස් ලිප |
| 39. | 19652 | ටීඑස්පී පොහොර කි. ග්‍රෑ. 50 ඇසුරුම් 01යි |
| 40. | 0774 | යූරියා වර්ගයේ පොහොර මිටි 10යි |
| 41. | 0774 | එම්ඕපී වර්ගයේ පොහොර මිටි 02යි |
| 42. | 0774 | ටීඑස්පී වර්ගයේ පොහොර මිටි 03යි |
| 43. | අංක රහිත | ගෑස් ලිප් 01යි |
| 44. | අංක රහිත | බීම කේස් 39 |
| 45. | අංක රහිත | 01" වතුර මෝටර් 01යි |
| 46. | අංක රහිත | 02" වතුර මෝටර් 01යි |
| 47. | අංක රහිත | ඇලුමිනියම් කල 03යි |
| 48. | අංක රහිත | ඇලුමිනියම් කොරහ 01යි |
| 49. | අංක රහිත | ප්ලාස්ටික් කල 03යි |
| 50. | අංක රහිත | ඇලුමිනියම් අඩි වලං 01යි |
| 51. | අංක රහිත | සිත්තා පැදුරු 04යි |
| 52. | අංක රහිත | ප්ලාස්ටික් පුටු 05යි |
| 53. | අංක රහිත | සවල් 01යි |
| 54. | අංක රහිත | සවල් 01යි |
| 55. | අංක රහිත | සවල් 01යි |
| 56. | අංක රහිත | සවල් 01යි |
| 57. | අංක රහිත | සවල් 01යි |
| 58. | අංක රහිත | සවල් 01යි |
| 59. | අංක රහිත | සවල් 01යි |
| 60. | අංක රහිත | තහඩු බාල්දි 01යි |
| 61. | අංක රහිත | තහඩු බාල්දි 01යි |
| 62. | අංක රහිත | තහඩු බාල්දි 01යි |
| 63. | අංක රහිත | තහඩු බාල්දි 01යි |
| 64. | අංක රහිත | තහඩු බාල්දි 01යි |
| 65. | අංක රහිත | තහඩු බාල්දි 01යි |
| 66. | අංක රහිත | ඇඳ පැති රාක්ක 01යි |
| 67. | අංක රහිත | නිවාස වයර් කැබලි උර 01යි |
| 68. | අංක රහිත | ටයර් ටියුබ් 01යි |
| 69. | අංක රහිත | ලනු තේඩා 04යි |
| 70. | අංක රහිත | දිග අඩි 05ක් වූ ඇස්බැස්ටෝස් ෂීට් 05යි |
| 71. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ ගැල්වනයිස් බට 09යි |
| 72. | අංක රහිත | සෙවිලි තහඩු 10යි |
| 73. | අංක රහිත | රිම් එක සහිත බස් රථ ටයර් 01යි |
| 74. | අංක රහිත | කුඩා බාස්කට් 02යි |
| 75. | අංක රහිත | මල් පෝච්චි අච්චු 01යි |
| 76. | අංක රහිත | තෙල් අඳින උපකරණ 01යි |
| 77. | අංක රහිත | ලොකු ට්‍රැක්ටර් හයිඩ්‍රොලික් පොම්ප සිලින්ඩර 01යි |
| 78. | අංක රහිත | පීරිසි 06යි, අඩුකෝප්ප 05යි |
| 79. | අංක රහිත | සිලිවින් ෆෑන් 01යි |
| 80. | අංක රහිත | සිලිවින් ෆෑන් 01 (තටු රහිත) |
| 81. | අංක රහිත | මිරිස් ගල් 01යි |
| 82. | අංක රහිත | ප්ලාස්ටික් පිඟන් 04යි |
| 83. | අංක රහිත | වීදුරු පිඟන් 01යි |
| 84. | අංක රහිත | ලොකු පුනීල 01යි |
| 85. | අංක රහිත | පාපැදි චේන් කේස් 01යි |
| 86. | අංක රහිත | අත් ඉසින යන්ත්‍ර 01යි |
| 87. | අංක රහිත | කුඩා රේඩියෝ 01යි |
| 88. | අංක රහිත | යතුරු ලියන යන්ත්‍ර 01යි |
| 89. | අංක රහිත | ක්‍රිකට් පිති 01යි |
| 90. | අංක රහිත | රෙදි මහන මැෂිමක සැකිල්ල |
| 91. | අංක රහිත | කුඩා වාහන ජැක් 01යි |
| 92. | අංක රහිත | අත්ට්‍රැක්ටර් රොටරි 01යි |
| 93. | අංක රහිත | යකඩ කූරු සහිත දිරා ඇති ජනේල 01යි |
| 94. | අංක රහිත | රෙදි කලාල 01යි |
| 95. | අංක රහිත | කැරකෙන පුටු 01යි |
| 96. | අංක රහිත | නැවත ආරෝපන කළ හැකි විදුලි පන්දම් 01යි |
| 97. | අංක රහිත | ඇලුමිනියම් කම්බි කැබලි සහිත උර 04යි |
| 98. | අංක රහිත | යකඩ ගේට්ටු 01යි |
| 99. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ යකඩ කැබලි 10යි |
| 100. | අංක රහිත | වාහන බෆර් 01යි |
| 101. | අංක රහිත | අඩි 14ක් පමණ දිග මි. මී. 10 වානේ කම්බි 05යි |
| 102. | අංක රහිත | ෆොග් ලයිට් 02යි |
| 103. | අංක රහිත | පාපැදි ඩයිනමෝව සහ ලයිට් 01යි |
| 104. | අංක රහිත | සවුන්ඩ් ඇම්ප්ලිෆයර් 01යි |
| 105. | 2013 වර්ෂයේ | භාවිතයට ගත නොහැකි තරමේ ස්ටූල් 02යි |
| 106. | භාණ්ඩ සමීක්ෂණ | භාවිතයට ගත නොහැකි තරමේ ඇඳි සහිත පුටු 06යි |
| 107. | වාර්තා අනුව වෙන්දේසියට නිර්දේශිත | භාවිතයට ගත නොහැකි තරමේ සාමාන්‍ය පුටු 06යි |

01-692

# රජයේ නොවන දැන්වීම්

## නිවේදනයයි

බෙරෙන්ඩිනාමයික්‍රෝ ඉන්වෙස්ට්මන්ට්ස් කම්පැණි ලිමිටඩ් 2014 නොවැම්බර් මස 20 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : බෙරෙන්ඩිනා මයික්‍රෝ ඉන්වෙස්ට්මන්ට්ස් කම්පැණි ලිමිටඩ්
සමාගමේ අංකය : පී බී 5235
ලියාපදිංචි කාර්යාලය : අංක 381/10, ස්වර්ණ පෙදෙස, නාවල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

01-665

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාර ඉනොඇක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2014 දෙසැම්බර් මස 24 වැනි දින සංස්ථාගත කරන ලද බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඉනොඇක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102548
ලියාපදිංචි කාර්යාලය : අංක 293/1, අලුබෝහේන, පෝරුවදණ්ඩ, හොරණ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

01-666

---

## දැන්වීමයි

ස්ක්‍රීන්ලයින් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ස්ක්‍රීන්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ් ඒකාබද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාර, ස්ක්‍රීන්ලයින් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් (SGPL) සහ ස්ක්‍රීන්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ් (SPL) යන සමාගම් ඒකාබද්ධ කිරීම සම්පූර්ණ කරන ලද බවත්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (1) (අ) වගන්තිය ප්‍රකාර 2014 දෙසැම්බර් මස 15 වැනි දින, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබූ බවත්, මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඒකාබද්ධ කළ සමාගම වන ස්ක්‍රීන්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ලියාපදිංචි කාර්යාලය කැලණිය, ගෝනවල, තල්වත්ත, අංක 18/4 හි පිහිටා ඇති බව ද දැනුම් දෙනු ලැබේ.

ස්ක්‍රීන්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සභාපති.

2014 දෙසැම්බර් මස 23 වැනි දින,

01 - 667

## නිවේදනයයි

පවර් ප්‍රොපර්ටි (ප්‍රයිවට්) ලිමිටඩ් 2014 නොවැම්බර් මස 10 වැනි දින සංස්ථාපනය දරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : පවර් ප්‍රොපර්ටි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 101647
ලියාපදිංචි කාර්යාලය : අංක 50, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

01-668

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

එම් බී එස් එල් සේවිංග්ස් බැන්ක් ලිමිටඩ් ( PB 358) හා එම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් (PB 61) මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී (පෙර මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී) (PQ 10) සමග ඒකාබද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තියට ප්‍රකාරව එම් බී එස් එල් සේවිංග්ස් බෑන්ක් ලිමිටඩ් හා එම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් යන සමාගම් මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී (පෙර මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී) සමග ඒකාබද්ධ වී ඇති බව දැනුම් දෙන්නෙමු. මේ අනුව ඒකාබද්ධිත සමාගම මර්චන්ට් බෑනක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී වේ. ඒකාබද්ධ වීම බලාත්මක වන්නේ 2015 ජනවාරි මස 1 වනදා සිටයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ්
ෆයිනෑන්ස් පීඑල්සී,
සමාගම් ලේකම්.

ලංකා බැංකු වෙළඳ කුළුණ, අංක 28,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

01-676

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීමයි

සමාගමේ නම : යුනි ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102767
සංස්ථාගත කිරීමේ දිනය : 2014.12.17
ලියාපදිංචි කාර්යාලය : අංක 28/1, රොඩ්රිගෝ ඇවනියු, ගල්පොත්ත පාර, නාවල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. එස්. ටී. මිරිහාන,
සමාගමේ ලේකම්.

01 - 678

## සිලෝන්කින් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම.

2014 දෙසැම්බර් මස 30 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 103092 යටතේ "සිලෝන්කින් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 5/16, "ශාන්ති", ගාලු පාර, කලුතර උතුර යන ස්ථානයේ බව අපි මෙයින් මහ ජනතාවට දැනුම් දෙමු.

සමාගමේ ලේකම්.

01-689

## නිවේදනයයි

ට්‍රාන්ස්ෆෝම් එනර්ජි සර්විසස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2014 දෙසැම්බර් මස 09 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ට්‍රාන්ස්ෆෝම් එනර්ජි සර්විසස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102501
ලියාපදිංචි කාර්යාලය : අංක 216, ද සේරම් පෙදෙස, කොළඹ 10.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

01-690

## නිවේදනයයි

එන් ඩී බී සෆර් පාර්ට්නර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2014 දෙසැම්බර් මස 24 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : එන් ඩී බී සෆර් පාර්ට්නර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102937
ලියාපදිංචි කාර්යාලය : අංක 40, නවම් මාවත, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මයෝමි හරේෂා සමරවික්‍රම,
සමාගම් ලේකම්.

01-691

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඒ ප්ලස් ඩී ග්‍රීන් බිල්ට් එන්වයරමන්ට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2015.01.02
සමාගමේ අංකය : පී වී 103166
ලියාපදිංචි කාර්යාලය : අංක 28/1, රොස්මිඩ් පෙදෙස, කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සමාගම් ලේකම්.

01-693

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ඌරගස්මන්හන්දිය, කිරිමැටියාව දරන ස්ථානයෙහි පදිංචි, තොම්මයා හකුරු සරත් සිරි කුමාර වන ම විසින් ඌරගස්මන්හන්දිය, කයිලත්ත දරන ස්ථානයෙහි පදිංචි හෙට්ටිගේ සම්පත් සුසන්න කුමාර මාගේ ඇටෝර්නි බලකරු කරමින් ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. නදී ප්‍රියංගනී කීර්තිරත්න මහත්මිය විසින් සැකසූ අංක 737 හා 2014.11.29 දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ඇති බැව් මෙමගින් ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට හා මහජනතාවට දන්වා සිටිමි.

තොම්මයා හකුරු සරත් සිරි කුමාර.

01-694

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආයතනය සීමිත වගකීම් සමාගමක් ලෙස සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමි.

01. සමාගමේ නාමය : ශ්‍රී ගජන් (ප්‍රයිවට්) ලිමිටඩ්
02. සමාගම් අංකය : පී වී 101122
03. සංස්ථාගත කළ දිනය : 2014.09.25 වැනි දින
04. ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 154, නවලාර් පාර, යාපනය.

සමාගම් අධ්‍යක්ෂ.

01-705

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) දරන ඡේදයට අනුව 2008 ජනවාරි මස 14 වැනි දින එස්. එම්. ලංකා ඔටෝ ඇක්සසරීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වමි.

සමාගමේ නම : එස්. එම්. ලංකා ඔටෝ ඇක්සසරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 62712
ලියාපදිංචි කාර්යාලය : අංක 20, නැදුරන පාර, ඇහැලියගොඩ.

ශ්‍යාමලී නිමල්කා අමරසිංහ,
සමාගමේ ලේකම්.

01-714

## ප්‍රසිද්ධ නිවේදනයයි

සොෆ්ට්ලොජික් කැපිටල් පීඑල්සී (ලියාපදිංචි අංක පීබී 779 පීකියු) ප්‍රකාශ කළ ප්‍රාග්ධනය අවකරණය කිරීම

සොෆ්ට්ලොජික් කැපිටල් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ සාමාන්‍යය කොටස් හැට අට කෝටි අසූ එක් ලක්ෂ හැටදාහක් (68, 81, 60,000) නියෝජනය කරන ප්‍රකාශ කළ ප්‍රාග්ධනය රුපියල් තුන්සිය හතලිස් නව කෝටි අසූ හතර ලක්ෂ හැට හතර දාහක (349,84, 64 000) සිට රුපියල් දෙසීය අසූ අට කෝටිය (288,000,000) දක්වා අඩු කිරීමට තමන්ගේ කොටස් කරුවනට වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 59 වන වගන්තිය යටතේ යෝජනා කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. සමාගමේ නිකුත් කළ සාමාන්‍ය කොටස් ගණනේ වෙනසක් සිදු නොවේ.

ඉහත සඳහන් ප්‍රාග්ධනය අවකරණය කිරීම සිදු කරනු ලබන්නේ සමාගමේ පාඩු වශයෙන් පෙන්වා ඇති රුපියල් හැට එක් කෝටි අසූහතර ලක්ෂ හැට හතර දාහක් (61, 84, 64 000) එහි ප්‍රකාශ කළ ප්‍රාග්ධනයෙන් අඩු කිරීමෙනි.

වර්ෂ 2005 මාර්තු මස 6 වැනි දින ඉහත සඳහන් ප්‍රාග්ධනය අවකරණය කිරීම සඳහා කොටස් කරුවන්ගේ අනුමැතිය විශේෂ යෝජනා සම්මතයක් මගින් ලබා ගැනීම සඳහා සමාගමේ අති විශේෂ මහා සභා රැස්වීමක් පවත්වනු ලැබිණි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සොෆ්ට්ලොජික් කෝපරේට් සර්විසස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 14, ද ෆොන්සේකා පෙදෙස,
කොළඹ 05.
2015 ජනවාරි මස 14 වැනි දින.

01-715

## ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 9 (1) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාපනය කරනු ලැබූ බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ප්‍රිමෝ ලෙදර් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී වී 101139
ලියාපදිංචි ලිපිනය : අංක 2 ඩීල් පෙදෙස, කොළඹ 03
සංස්ථාපනය කරනු ලැබූ දිනය : 2014 සැප්තැම්බර් මස 25 වැනි දින.

කේ. එච්. එල්. කෝපරේට් සර්විසස් ලිමිටඩ්,
ලේකම්වරුන්.

01-716

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

අංක 78, ඇවනිව් ඩී සෆ්රන් 75015 පැරිස් ප්‍රංශයේ පදිංචි මුණසිංහ ආරච්චිගේ කුසුමා පෙරේරා වන මා වර්ෂ 2014 ජුනි මස 24 වැනි දින ප්‍රංශයේ තානාපති විසින් සහතික කරන ලද අංක 187/14 රන ඇටෝර්නි බලකරය මගින් අංක 420/2 හයිලෙවල් පාර, මීගොඩ පදිංචි වැඩිප්පුලි ආරච්චිගේ රේණුකා ප්‍රියදර්ශනී යන අයට දී තිබූ ඉහත සඳහන් කරන ලද ඇටෝර්නි බලකරය වර්ෂ 2014 දෙසැම්බර් මස 24 වැනි දින සිට බලනොපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරන බව ට සියලු මහජනයාට දැනුම් දෙනු ලබන අතර මෙදිනෙන් පසුව එකී ඇටෝර්නි බලකාරිය විසින් මා වෙනුවෙන් සිදු කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

මුණසිංහ ආරච්චිගේ කුසුමා පෙරේරා.

01-719

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රුග්ගහවිල, උඩුගහවල්පොල අංක 85/බී/4 හි පදිංචි කිරිපෝරුවගේ අජිත් කුමාරසිංහ වන මා විසින් වර්ෂ 2008 ක් වූ මැයි මස 15 වැනි දිනැතිව බර්මියුඩා සිට බාලා නඩරාජා බැරිස්ටර් නීතිඥ සහ දිවුරුම් කොමසාරිස් ඉදිරිපිට දී ලියා සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් ඌරාපොල, මීවිටිගම්මන, අංක 33/සී හි පදිංචි කිරිපෝරුවගේ මල්ලිකා කුමාරසිංහ යන අයට පැවරූ සියලු හිමිකම් මෙයින් අවලංගු කර සිටිමි. එකී ඇටෝර්නි බලපත්‍ර අවලංගුව 2014.12.19 වැනි දින සිට බලපැවැත්වෙන බවටත් එමගින් සිදු කරනු ලබන සියලු කටයුතු නීත්‍යානුකූල නොවන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

01-724

**සමාගමේ තත්ත්වය වෙනස් වීම පිළිබඳ මහජනතාව වෙත දැනුම් දීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ, 9 (2) වගන්තියට අනුව පහත සඳහන් සමාගමේ තත්ත්වය වෙනස් වූ බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

පෙර සමාගම් නාමය : සියපත ෆිනෑන්ස් ලිමිටඩ්
පෙර සමාගම් ලියාපදිංචි අංකය : පී බී 917
නව සමාගම් නාමය : සියපත ෆිනෑන්ස් පීඑල්සී
නව සමාගම් ලියාපදිංචි අංකය : PB 917 PQ
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02.

ආර්. එල්. එස්. සේනාරත්න,
සමාගම් ලේකම්.

01-655

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

තලංගම උතුර, කන්දවත්ත අංක 673 ජී දරන ස්ථානයේ පදිංචි අංක 611550952 වී දරන ජාතික හැඳුනුම්පත හිමි පරණ හේවාගේ ඥානතිලක වන මම කොළඹ, නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ශ්‍රීමතී කොඩිකාර විසින් සහතික කොට කොළඹ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තු කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 205 කාණ්ඩයේ 42 වැනි පත් ඉරුවේ 10109 දින පොත් අංකය යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති ඇටෝර්නි බලපත්‍රයෙන් මගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු ලෙස තලංගම උතුර, කන්දවත්ත අංක 673 ජී දරන ස්ථානයේ පදිංචි අංක 352310212 වී දරන ජාතික හැඳුනුම්පත හිමි පරණහේවාගේ සයිමන් වෙත කර තිබුණු පත් කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට අවලංගු කරන ලද බව සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

පරණහේවාගේ ඥානතිලක,

2014 දෙසැම්බර් මස 29 වැනි දින.

01-113

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඇවෙන්ට් ලෙෂර් හෝලිඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී. 102993
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 163, බංගලාය හංදිය, කෝට්ටේ පාර, කෝට්ටේ
ලියාපදිංචි දිනය : 2014.12.23

සමාගමේ නම : ඇවෙන්ට් ඉන්ටර්නැෂනල් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී. 102992
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 163, බංගලාව හංදිය, කෝට්ටේ පාර, කෝට්ටේ
ලියාපදිංචි දිනය : 2014.12.23

ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු

01-651

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : මොකෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී. 102849
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 284/10, පිටිපන උතුර, හෝමාගම
ලියාපදිංචි දිනය : 2014.12.16

සමාගමේ නම : ටයිප්ෆි සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී. 102820
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : හැව්ලොක් සෙන්ට්‍රල් 104, 4/1, හැව්ලොක් පාර, කොළඹ 05

ලියාපදිංචි දිනය : 2014.12.15
සමාගමේ නම : නෙක්සස් නුබාර්ට් රියල්ටෝර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී. 101603
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 34/21 (17/2), ජස්මින් පාර්ක්, නාරාහේන්පිට පාර, නාවල.
ලියාපදිංචි දිනය : 2014.11.24

ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු.

01-650

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (01) වගන්තිය ප්‍රකාර, ප්‍රසිද්ධ දැන්වීමයි

| *ආයතනයේ නම* | *පී වී අංකය* | *ලියාපදිංචි ලිපිනය* |
|---|---|---|
| රන්මීර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 100580 | රන්මීර් ඉන්ධන පිරවුම්හල, තවලම, ගාල්ල |
| කාර් බේස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 62070 | අංක 36/21, කෙත්සිරි උද්‍යානය, පෙරේරා ප්ලේස්, දෙහිවල |
| ටී සෝන් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 100725 | අංක 76, ස්ටීල් පාර, ගාල්ල |
| ජී ඇන්ඩ් ඒ හෝල්ඩිංග් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 101157 | අංක 76, කෝන්ගහ පාර, ගාල්ල |
| අයිලම් ඔයිල් මිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 101246 | අංක 33/3, අකුරැස්ස පාර, ගාල්ල |
| තුර්කි රෙස්ටොරන්ට ඇන්ඩ් කොෆී බාර් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 101521 | වයිට් හවුස්, උඩුපිල, මිරිස්ස |
| බේටා ට්‍රැවල්ස් ගෝල් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 101574 | තුන්වන මහල, අංක 34, සේලක සාප්පු සංකීර්ණය, ගාමිණී මාවත, ගාල්ල |
| ෆෝර්ට් චේම්බර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 101759 | අංක 40, පල්ලිය පාර, කොටුව ගාල්ල |
| රෙස්කි බිස්නස් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 102146 | අංක 18, ඕවිට මාවත, බංගලාවත්ත, මාබෝල, වත්තල |
| ද රත්තරං වත්ත (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 102478 | රත්තරං වත්ත, හීනටිගල, තල්පෙ |
| හබීබ් ජෙනරල් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 102727 | අංක 49 - 1/1, ශ්‍රී සිවනන්ද වීදිය, කොටහේන, කොළඹ 13 |
| ඔර්කිඩ් හවුස් බුටික් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 102896 | අංක 28 ඒ, ඉස්පිරිතාල වීදිය, කොටුව, ගාල්ල. |

එම්. එන්. ඇසෝසියේට්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 51, තුන්වැනි පටුමග, කටුගොඩ, ගාල්ල.

01-672

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

සෙන්බිම ෆිනෑන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ගිණුම් අංක : 0035 1000 6894,

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014 සැප්තැම්බර් මස 25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හතලිස් හත් ලක්ෂ අසූ දහස් හැත්තෑ එකයි ශත තිස් තුනක (රු. 4,780,071.33) මුදල ද, 2014 සැප්තැම්බර් මස 03 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් එක් ලක්ෂ අනූ හතර දහස් හයසිය එකොළහයි ශත දහ හතරක (රු. 4,194, 611.14) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2014.10.31 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* හා 2014.10.20 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2015.02.13 වැනි දින ප. ව. 12.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගගබොඩ පත්තුවේ පහළ කිම්බිය සහ ඉහල කිම්බියේ මැද කිම්බියේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි "තුන්දොල එස්ටේට් හි ලොට් ඒ හි ලොට් ඒ 1 හි ඒකාබද්ධ සහ යාබද සීමා නිර්ණය කළ ලොට් A1A සහ ලොට් A1B " යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. ජී. උපසේන යන අය විසින් සාදන ලද 2012 පෙබරවාරි මස 16 දාතම හා අංක 1030 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 55 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 89 (අඩි 20 පලල පාර සඳහා වෙන්කිරීම) නැගෙනහිරට : ලොට් 89 (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම) දකුණට : ලොට් 88 සහ 87 සහ බස්නාහිරට : ලොට් 95 සහ 56 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම තුනයි හතරක් (අ. 0, රූ. 0, පර්. 14.34) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1030 දරන පිඹුරට අනුවය.

2. එකී මැද කිම්බියේ පිහිටි "තුන්දොළ එස්ටේට් හි ලොට් A හි ලොට් A 1 හි ඒකාබද්ධ සහ යාබද සීමා නිර්ණය කළ ලොට් A1A සහ ලොට් A1B යයි කියනු ලබන ඉඩමේ අංක 1030 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 81 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 95 නැගෙනහිරට : ලොට් 82 දකුණට : ලොට් 82 සහ පාර සහ බස්නාහිරට : ලොට් 95 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම එකයි දෙකක් (අ. 0, රූ. 0 ,පර්. 11.12) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්,

පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 1030 දරන පිඹුරට අනුවය.

3. එකී මැද කීම්බියේ පිහිටි "තුන්දොල එස්ටේට් හි ලොට් A' හි ලොට් A 1 හි ඒකාබද්ධ සහ යාබද සීමානිර්ණය කළ ලොට් A1A සහ ලොට් A1B යයි කියනු ලබන ඉඩමේ අංක 1030 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 82 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 95 නැගෙනහිරට : ලොට් 83 දකුණට : ලොට් 83 සහ පාර සහ බස්නාහිරට : ලොට් 81 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතයි දශම අටයි දෙකයි (අ. 0 රූ. 0 පර්. 17.82) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 1030 දරන පිඹුරට අනුවය.

4. එකී මැද කීම්බියේ පිහිටි "තුන්දොළ එස්ටේට් හි ලොට් A හි ලොට් A 1 හි ඒකාබද්ධ සහ යාබද සීමානිර්ණය කළ ලොට් A1A සහ ලොට් A1B" යයි කියනු ලබන ඉඩමේ අංක 1030 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 83 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 95 නැගෙනහිරට : ලොට් 84 දකුණට : පාර සහ බස්නාහිරට : ලොට් 82 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම හතරයි හතරක් (අ. 0 රූ. 0 පර්. 18.44) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 1030 දරන පිඹුරට අනුවය.

5. එකී මැද කීම්බියේ පිහිටි "තුන්දොළ එස්ටේට් හි ලොට් A හි ලොට් A 1 හි ඒකාබද්ධ සහ යාබද සීමානිර්ණය කළ ලොට් A1A සහ ලොට් A1B" යයි කියනු ලබන ඉඩමේ අංක 1030 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 84 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 95 නැගෙනහිරට : ලොට් 85 දකුණට : පාර සහ බස්නාහිරට : ලොට් 83 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම හතරයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 14.42) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 1030 දරන පිඹුරට අනුවය.

6. එකී මැද කීම්බියේ පිහිටි "තුන්දොළ එස්ටේට් හි ලොට් A හි ලොට් A 1 හි ඒකාබද්ධ සහ යාබද සීමානිර්ණය කළ ලොට් A1A සහ ලොට් A1B" යයි කියනු ලබන ඉඩමේ අංක 1030 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 85 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 95 නැගෙනහිරට : ලොට් 86 දකුණට : පාර සහ බස්නාහිරට : ලොට් 84 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම එකයි අටක් (අ. 0 රූ. 0 පර්. 14.18) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 1030 දරන පිඹුරට අනුවය.

7. එකී මැද කීම්බියේ පිහිටි "තුන්දොල එස්ටේට් හි ලොට් A හි ලොට් A 1 හි ඒකාබද්ධ සහ යාබද සීමානිර්ණය කළ ලොට් A1A සහ ලොට් A1B" යයි කියනු ලබන ඉඩමේ අංක 1030 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 86 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 95 නැගෙනහිරට : ලොට් 87, දකුණට : පාර සහ බස්නාහිරට : ලොට් 85 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම එකයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 12.12) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 1030 දරන පිඹුරට අනුවය.

8. එකී මැද කීම්බියේ පිහිටි "තුන්දොල එස්ටේට් හි ලොට් A හි ලොට් A 1 හි ඒකාබද්ධ සහ යාබද සීමානිර්ණය කළ ලොට් A1A සහ ලොට් A1B" යයි කියනු ලබන ඉඩමේ අංක 1030 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 87 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 55, නැගෙනහිරට : ලොට් 88 දකුණට : පාර සහ බස්නාහිරට : ලොට් 86 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම නමයයි හයක් (අ. 0 රූ. 0 පර්. 11.96) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 1030 දරන පිඹුරට අනුවය.

9. එකී මැද කීම්බියේ පිහිටි "තුන්දොල එස්ටේට් හි ලොට් A හි ලොට් A 1 හි ඒකාබද්ධ සහ යාබද සීමානිර්ණය කළ ලොට් A1A සහ ලොට් A1B" යයි කියනු ලබන ඉඩමේ අංක 1030 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 88 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 55, නැගෙනහිරට : ලොට් 89, දකුණට : පාර සහ බස්නාහිරට : ලොට් 87 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම පහයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 14.52) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 1030 දරන පිඹුරට අනුවය.

අංක 1030 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 89 (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම) දිගේ ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

ඉහත කී ඉඩම් ඒකාබද්ධ හා යාබද ඉඩම් වල උප බෙදුමක් හා නැවත බෙදුමක් වන අතර පහත සඳහන් පරිදි විස්තර කොට ඇත.

එකී මැද කීම්බියේ පිහිටි 'තුන්දොළ එස්ටේට් හි ලොට් A හි කොටසක ලොට් ඒ A 1 " යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වී. ජී. උපසේන යන අය විසින් සාදන ලද 2008 ජනවාරි මස 26 දාතම හා අංක 692 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් A1a වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට :TPP 213184 සහ 222515 මගින් හිමිකම් කියනු ලබන ඉඩම්, නැගෙනහිරට : TP 168583 සහ එම ඉඩමේ ලොට් A1b, දකුණට : ලොට් A1b සහ පාර සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර අටයි රූඩ් එකයි පර්චස් තිස් හතයි දශම නමයයි පහක් (අ. 8 රූ. 1 පර්. 37.95) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම

මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 692 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව H 144/275 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී මැද කිම්බියේ පිහිටි 'තුන්දොළ එස්ටේට් හි ලොට් A හි ලොට් A 1 " යයි කියනු ලබන ඉඩමේ අංක 692 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට් බෙදාවෙන්කොට ලොට් A1b වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට TP 168583 සහ ලොට් Ala ගිණිකොනට :TP 219466 නිරිතට ප්‍රධාන පාරට පාර සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් A1A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටක් (අ. 0 රූ. 1 පර්. 8) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 692 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව H 144/257 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

01-703/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එම්. එම්. ඩී. පී. පෙරේරා
ගිණුම් අංක : 1035 5419 0834

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014 සැප්තැම්බර් මස 25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට හතර ලක්ෂ පනස් දෙදහස් හයසිය පහයි ශත අසූ හයක (රු. 64,52,605.86) මුදලද, 2014 සැප්තැම්බර් මස 03 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් හත් ලක්ෂ අනූ එක් දහස් නමසිය අසූ අටයි ශත පනස් හතක (රු. 57,91,988.57) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළිය ද, දැන්වීම ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වේතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2014.10.31 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* හා 2014.10.20 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2015.02.13 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීමාවන් තුළ කහඳුවවත්ත 124 C ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිතුලම්පිටිය පිහිටි "ගෙදරවත්ත නොහොත් තන්තිලගේවත්ත නොහොත් දෙණියේවත්ත හි යාබද හා ඒකාබද්ධ ලොට් C 6 [1] හි ලොට් A සහ B යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. ජී. උපසේන යන අය විසින් සාදන ලද 2013 මාර්තු 15 දාතම හා අංක 1176 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 6 සහ පාර නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 2 දකුණට : මෙම ඉඩමේ ලොට් 2 සහ බස්නාහිරට : ප්‍රධාන පාරේ සිට පාර (අංක 560 දරන පිඹුරේ ලොට් C 9) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හයයි පහක් (අ. 0 රූ. 0 පර්. 20.65) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව R 29/05 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

